JSS 2025 3(1): 162-177

Journal of Social Sciences (JSS)
Volume 03 – Issue 01

DOI: 10.4038/jssnisd.v3i1.31

# A conceptual analysis of the conflict

## 'ගැටුම' පිළිබඳ සංකල්පීය විශ්ලේෂණයක්

**Madhubhashani J.L.A.U. [1*] , Subasinghe W.[2] , Herath O.[3]**

[1]Corruption Prevention officer, Commission to Investigate Bribery and Corruption , Sri Lanka
**ORCID ID: https://orcid.org/0009-0007-7231-3224**
[2]Department of Sociology, University of Kelaniya, Sri Lanka
**ORCID ID:** https://orcid.org/0009-0004-9132-3696
[3]Department of Philosophy, University of Kelaniya, Sri Lanka
**ORCID ID: https://orcid.org/0009-0004-2181-3251**

## ABSTRACT

*This research, titled "Conceptual Analysis of Conflict", is an attempt to understand the concept of conflict from various scientific perspectives. It examines the nature of conflict, causes of conflict, classification of conflict, and the theoretical basis of conflict. Conflict is a complex and dynamic concept that has existed at various levels since the dawn of human society. Conflicts that have existed since the beginning of human history continue to evolve through various evolutions and manifestations, and they emerge at the personal, social and international levels. Identifying the root causes of conflict, their nature and trends is essential for successful intervention in conflict resolution. In this research, a conceptual understanding of conflict was built using a literature review and thematic analysis methodology based on secondary data. The theories used by scholars in various fields to analyze conflict are reviewed here, based on a human and sociological perspective and a detailed analysis of the types of conflicts, the causes of such conflicts and the ways to resolve them is presented. The challenges of analyzing conflicts in the complex "identity" of today's society are also particularly highlighted. This article emphasizes the need for a deeper understanding of conflict in order to establish peace.*

***Keywords:*** *Conflict, Conflict Resolution, Conceptual Analysis, Peace*

**Corresponding Author:** Hettige N.[1*], Email : **jayasekaraus@gmail.com**

**සංක්ෂේපය**

මෙම පර්යේෂණය, "ගැටුම පිළිබඳ සංකල්පීය විශ්ලේෂණය" යන මාතෘකාව යටතේ, ගැටුම යන සංකල්පය විවිධ විද්‍යාත්මක දෘෂ්ටිකෝණවලින් අවබෝධ කර ගැනීමෙහි උත්සාහයකි. ඒ අනුව ගැටුමෙහි ස්වභාවය, ගැටුමට හේතු, ගැටුම් වර්ගීකරණය සහ ගැටුමෙහි න්‍යායාත්මක පදනම සොයා බලයි. ගැටුම යනු මානව සමාජයේ ඉතිහාසයේ සිට පැවතෙන, විවිධ මට්ටම්වල පවතින සංකීර්ණ හා ගතික සංකල්පයකි. මිනිසාගේ ඉතිහාසයේ ආරම්භයේ සිටම පැවති ගැටුම් තවදුරටත් විවිධ පරිණාමයන් සහ ප්‍රකාශන මගින් විකාශනය වන අතර, ඒවා පුද්ගලික, සමාජමය හා ජාත්‍යන්තර මට්ටම්වල දී මතු වේ. ගැටුමක ඇතිවන මූලික හේතු, ඒවායේ ස්වභාවය හා ප්‍රවණතා හඳුනා ගැනීම, ගැටුම් විසඳුම් පිළිබඳව සාර්ථක මැදිහත් වීම සඳහා අත්‍යවශ්‍ය වේ. මෙම පර්යේෂණයේදී ද්විතීයික දත්තයන් මත පදනම්ව සාහිත්‍ය සමාලෝචන සහ තේමාත්මක විශ්ලේෂණය ක්‍රමවේදයක් භාවිතා කරමින් ගැටුම පිළිබඳ සංකල්පීය අවබෝධයක් ගොඩනගන ලදී. විවිධ අංශයන්හි විද්වතුන් ගැටුම් විශ්ලේෂණය සඳහා භාවිතා කරන න්‍යායන්, මානව හා සමාජ විද්‍යාත්මක දැක්මක් මත පදනම්ව ගැටුම් වර්ග, එවන් ගැටුම් ඇතිවීමේ හේතු හා විසඳුම් මාර්ග පිළිබඳ සවිස්තර විශ්ලේෂණයක් ඉදිරිපත් කරයි. වර්තමාන සමාජයේ සංකීර්ණ "අනන්‍යතාව" තුළ ගැටුම් විශ්ලේෂණය කිරීමේ අභියෝග ද මෙහිදී විශේෂයෙන් අවධානයට ලක්වෙයි. තවද සාමය ස්ථාපනය කිරීම සඳහා ගැටුම වඩාත් ගැඹුරු ලෙස තේරුම් ගැනීමේ අවශ්‍යතාවය මෙම ලිපිය මගින් අවධාරණය කෙරේ.

**මුඛ්‍ය පද : ගැටුම්, ගැටුම් නිරාකරණය, සංකල්පීය විශ්ලේෂණය, සාමය**

## 1. ගැටුම හැඳින්වීම

ගැටුම් මානව වර්ගයාගේ ආරම්භයේ සිටම ආරම්භ වූවක් වන අතර මේ දක්වා අඛණ්ඩව විකාශනය වෙමින් පවතින්නකි. ගැටුමකට මූල හේතු, තීව්‍රතාවය සහ ප්‍රවේශ ක්‍රම කලින් කලට වෙනස් වී තිබිය හැකි වුවද, ගැටුම් තවමත් ලොව පුරා විවිධ ආකාරවලින් සහ ක්‍රමවලින් සිදුවෙමින් පවතී. ගැටුම් යනු මානව අන්තර්ක්‍රියා වල නොවැළැක්විය හැකි කොටසකි, එය පුද්ගලික එකඟ නොවීම්වල සිට මහා පරිමාණ ජාත්‍යන්තර ආරවුල් දක්වා විවිධ මට්ටම්වල සිදු වේ. ගැටුමක් ඇති වන විට, කණ්ඩායම්, පුද්ගලයින් හෝ සංවිධාන විසින් ගැටුමක විවිධ අවධීන්හිදී ක්‍රියාකාරීව හෝ නිෂ්ක්‍රීයව අවතීර්ණය වේ. මෙහිදී විවිධ මැදිහත් වීම් මගින් ගැටුම් විසඳීම සඳහා ගැටලුව විසඳීමට බොහෝ උත්සාහයන් ඇත. විවිධ බුද්ධිමතුන්, සමාජ විද්‍යාඥයින් මෙන්ම න්‍යායාචාර්යවරුන් විසින් විශේෂිත ගැටුම් හා ගැටුම් විශ්ලේෂණය පිළිබඳ සුදුසු

විශ්ලේෂණ ක්‍රම හඳුන්වා දෙන අතර සෑම විටම ගැටුමේ මූල හේතු, ඒවායෙහි ස්වභාවය හඳුනා ගැනීමට මග පාදමින් එය තීව්‍ර වීමට ඉඩ නොදී ගැටුම විසඳීමට මග පාදයි. වර්තමාන තත්වය තුළ ගැටුමට සම්බන්ධ කණ්ඩායම් හෝ පාර්ශවයන්ගේ " අනන්‍යතාවය" වඩාත් සංකීර්ණ ස්වභාවයක් ගන්නා බැවින් ඒවා තේරුම් ගැනීමට නොහැකිවීම ගැටුම් විශ්ලේෂකයින්ට ප්‍රධාන අභියෝගයක් වී ඇත. විද්වතුන් ගැටුම් විශ්ලේෂණය කර ඇත්තේ එහි හේතු, වර්ග සහ විසඳුම් යාන්ත්‍රණයන් තේරුම් ගැනීම සඳහා මනෝවිද්‍යාව, සමාජ විද්‍යාව සහ දේශපාලන විද්‍යාව ඇතුළු බහු දෘෂ්ටිකෝණවලින් ය.

## 2. පර්යේෂණ ගැටලුව

ඉතිහාසය පුරාම මිනිසාගේ සමාජ ජීවිතය තුළ ගැටුම් නිරන්තර අංගයක් වී තිබේ. එමගින් පැහැදිලි වන්නේ, ගැටුම් යනු මිනිස් අන්තර්ක්‍රියා වලින් වලක්වන්නට නොහැකි, සංකීර්ණ හා ගතික ස්වභාවයක් සහිත සමාජමය ප්‍රතිඵලයක් බවයි. කෙසේ වෙතත්, වර්තමාන සමාජය තුළ ගැටුම්වල ස්වභාවය, ඒවායේ මූල හේතු හා මතුවන ආකාරය විශාල වෙනස්කම්වලට ලක්වී ඇති අතර, මෙම නවීන ගැටුම් තත්ත්වයන් සඳහා සම්ප්‍රදායික විශ්ලේෂණාත්මක ආකෘති සුදුසු නොවීම දැක්වෙයි. ගැටුම පිළිබඳ නිශ්චිත හා ඒකාබද්ධ නිර්වචනයක් නොමැතිවීමත්, සමාජ-දේශපාලනීය අනන්‍යතාවයන්ගෙන් ගැටුම් තවදුරටත් සංකීර්ණ වීමත් මෙම පර්යේෂණයේ ප්‍රධාන ගැටළුව වේ.

## 3. පර්යේෂණ අරමුණ

මෙම පර්යේෂණයේ ප්‍රධාන ඉලක්කය වන්නේ "ගැටුම" යන සංකල්පය සංකීර්ණ සමාජ ක්‍රියාවලියක් ලෙසින් සවිස්තරව විශ්ලේෂණය කිරීමයි. එමඟින් ගැටුම්වල ස්වභාවය, වර්ගීකරණය, මූලික හේතු සහ ගැටුම් විසඳුම් පිළිබඳ සංකල්පීය අවබෝධයක් ගොඩනගා ගැනීමට උත්සාහ කරයි. විවිධ සමාජ විද්‍යාත්මක, මනෝවිද්‍යාත්මක හා දේශපාලන විද්‍යාත්මක පසුබිම් සලකා බැලීමෙන් ගැටුම පිළිබඳ විවිධ දෘෂ්ටිකෝණ විවරණය කිරීමටත්, ඒ මගින් වත්මන් සමාජයේ ගැටුම් පිළිබඳ විග්‍රහයක් සැපයීමටත් මෙම පර්යේෂණය උත්සාහ කරයි.

## 4. පර්යේෂණ ක්‍රමවේදය

මෙම පර්යේෂණ පත්‍රිකාවේ පර්යේෂණ ක්‍රමවේදය කෙරෙහි අවධානය යොමු කල විට මෙම අධ්‍යයනය සම්පූර්ණයෙන්ම ද්විතීයික දත්ත මත පදනම් වේ. අධ්‍යයනය මගින් අධ්‍යයන සඟරා, පොත්, ලිපි සහ ජාත්‍යන්තර ආයතනවල ප්‍රකාශන ඇතුළු පවතින

සාහිත්‍ය පිළිබඳ පුළුල් සමාලෝචනයක් සහ තේමාත්මක විශ්ලේෂණයක් සිදු කර ඇත. මෙම විවිධ මූලාශ්‍ර විංශ්ලේෂණය කිරීමෙන්, ගැටුම පිළිබඳ සංකල්පීය විශ්ලේෂණයක් මෙම පර්යේෂණ පත්‍රිකාව මගින් සිදු කර ඇත.

### 5. සාහිත්‍ය විමර්ශනය

ගැටුම් අධ්‍යයනය කිරීම විවිධ විද්‍යාත්මක ක්ෂේත්‍රයන් තුළ විවිධ ආකාරයෙන් වර්ධනය වී ඇත. Coser **(1956)** විසින් ගැටුම සමාජීය විකාශය සඳහා අවශ්‍ය අංගයක් ලෙස හඳුනා දී ඇති අතර, Burton **(1990)** විසින් එය මූලික මානුෂීය අවශ්‍යතා නොපිරවීමේ ප්‍රතිඵලයක් ලෙස සලකා ඇත. ඔහුගේ Human Needs Theory අනුව, අනන්‍යතාවය, ආරක්ෂාව, සහභාගීත්වය වැනි අවශ්‍යතා නොපිරවීම නිසා පද්ධතිමය ගැටුම් ඇතිවේ.

Galtung (1990) විසින් ඉදිරිපත් කළ *Structural and Cultural Violence Theory* යටතේ, සෘජු ආකාරයෙන් පෙනී නොපෙනී ක්‍රියාත්මක වන ගැටුම් ආකෘති (නීති, භාෂාව, සන්නිවේදන මාදිලි) සාමයකට බාධා වේ. මෙය සෘජු (direct), ව්‍යුහමය (structural) හා සංස්කෘතික (cultural) ආකාරයන්ට වෙන් කර ගනී.

Lederach (2003) විසින් ඉදිරිපත් කළ *Conflict Transformation* සංකල්පය අනුව, ගැටුම යනු ප්‍රතික්ෂේප කල යුතු දෙයක් නොව, පද්ධති හා සබඳතා නැවත සැලසුම් කිරීමට අවස්ථාවක් ලෙස සැලකිය යුතු වේ. ඔහු ව්‍යවහාරික මට්ටමේ සාමය සඳහා සංස්කෘතික ගැඹුරක් සහ ගැටුම පිළිබඳ සංවාදය අවශ්‍ය බව යෝජනා කරයි.

### 6. ගැටුම නිර්වචනය කිරීම

ගැටුම යන වචනය බොහෝ විට භාවිතා වන්නේ යුද්ධයන් පිළිබඳව වන නමුත් ගැටුම යන්න ඊට වඩා පුළුල් වපසරියක් පුරා විසිර පවතින්නකි. ඒ අනුව ගැටුම යන්න ඉතාමත් සංකීර්ණ, ගතික ස්වභායක් සහිත හා ඉතාමත් පුළුල් සංකල්පයක් වේ. ඒ සඳහා විවිධ අන්දමේ නිර්වචනයන් ද රැසක් ලෝකයේ ඉදිරිපත්ව පවතී. ගැටුම යන්න නිශ්චිතවම නිර්වචනය කල නොහැකි සංකල්පයක් වන නමුත් පහත නිර්වචනයන් පොදුවේ ගැටුම යන්න හැඳින්වීම සඳහා අපට යොදා ගත හැකිය.

ගැටුම පිළිබඳ විශේෂඥයකු වන ජොහාන් ගැල්ටුන්ග් හඳුන්වන පරිදි "ගැටුම යනු ව්‍යක්තියකට හෝ සමූහයකට තිබෙන අභිප්‍රේරණ (ආශාවන්, ඉල්ලීම්, උවමනා) දෙකක්

හෝ ඊට වැඩි සංඛ්‍යාවක් එකිනෙකාට අසමගික වන තත්ත්වයකි. මෙම විකල්ප අභිප්‍රේරණ සපුරාලිය නොහැකි වීමෙන් ගැටුම ඇති වේ" (Galtung, 1969).

මෙය ජොහාන් ගැල්ටුන්ග් විසින් 1960 දශකයේ හඳුන්වා දුන් "ගැල්ටුන්ග් ත්‍රිකෝණය (Conflict Triangle)" සංකල්පයට ආශ්‍රිතවද හඳුන්වනු ලැබේ. එම ත්‍රිකෝණය තුළ

- සෘජු ප්‍රචණ්ඩත්වය (Direct violence)
- ව්‍යූහාත්මක ප්‍රචණ්ඩත්වය (Structural violence)
- සංස්කෘතික ප්‍රචණ්ඩත්වය (Cultural violence)

මෙම සාධක ත්‍රිත්වය ගැටුමක් වටා පවතින විවිධ පැතිකඩ ලෙස ඔහු විස්තර කරයි.

මිනිසෙක් යම් දෙයක් සම්බන්ධයෙන් තීරණයක් ගැනීමට යාමේදී එම පුද්ගලයාගේ සිතෙහි බිහිවන විකල්පයන් අතර ඇති වන සට්ටනය ගැටුමක් යන්නෙහි සරලම අර්ථකතනය ලෙස තුෂාර විතාරණ හා කාංචනා චන්ද්‍රසේකර විසින් ගැටුම් නිරාකරණය ග්‍රන්ථය තුළ දක්වා ඇත. (විතාරණ චන්ද්‍රසේකර, 2012).


**ඇමරිකානු ජාතික භෞතික විශේෂඥයන් වන ජෙහාන් සහ මැන්කින්ස්** හඳුන්වන පරිදි ගැටුමේ ප්‍රධාන වශයෙන් පහත සඳහන් ආකාරයට කොටස් තුනක් යටතේ හඳුනාගෙන ඇත (Jehn ) Mannix, 2001).

1. සබඳතා ගැටුම - පුද්ගලයින් අතර නොසන්සුන්කම නිසා ඇති වන ගැටුම.
2. කාර්ය ගැටුම - කාර්යයන් සම්බන්ධයෙන් ඇති වන විවිධ මත අතර හා විවිධ දෘෂ්ටිකෝණ අතර ඇති නොගැලපීම නිසා ඇති වන ගැටුම.
3. ක්‍රියාවලි ගැටුම - කණ්ඩායමක් විසින් ගතයුතු ක්‍රියාවලි පිළිබඳ එකඟතාව නොමැතිකම නිසා ඇති වන ගැටුම.

බොහෝ සමකාලීන ගැටුම් අසමමිතික වන අතර ඒවා බලයේ සහ තරාතිරමේ අසමානතාවයන් මගින් වර්ධනය වනු ලැබේ. බොහෝ සමකාලීන ගැටුම් දිග්ගැස්සුනු ඒවා වන අතර, ඒවා නැවත නැවතත් ප්‍රචණ්ඩත්වය වෙත ගමන් කරයි. දිගු කාලීන ගැටුම් සමාජයීය හා ආර්ථිකමය වශයෙන් ලෝකයේ රටවල් සඳහා සෘණාත්මක බලපෑම් ඇති කරයි. තවද, දේශීය අරගල මගින් සහ අවි වෙළඳාම මෙන්ම බාහිර රාජ්‍යයන් විසින් පාලන තන්ත්‍ර හෝ කැරලිකරුවන්ට සහාය දීම වැනි ගෝලීය සාධක මගින් ගැටුම් තවත් සංකීර්ණ කරයි.

**ගැටුමේ පොදු ලක්ෂණ**

රූපය 1: ගැටුම - තීව්‍රතා සන්තතිය




(**මූලාශ්‍රය**: Doi, 2007)

බොහෝ විට ගැටුම් පිළිබඳ අවධානය යොමු වන්නේ, එය සමාජයේ මතුපිටට පෙනෙන අවස්ථාවේදීය. එනම් ගැටුම ඇති වන අවසාන අදියරේදී ය. එය ගැටුම් දෘශ්‍යමාන වන ස්ථානය වේ. ගැටුම හඳුනා ගැනීමෙන් පසු පාර්ශවයන් අතර අන්තර්ක්‍රියා ඇති වන පළමු අවස්ථාව මෙයයි.

සුළු එකඟ නොවීම්, වෙනත් පුද්ගලයෙකුගේ දෘෂ්ටිකෝණයට හෝ ස්ථාවරයට අභියෝග කිරීම, වාචික ප්‍රහාර, තර්ජන, සටන් සහ ලේ වැගිරීම් යන සියල්ලම ගැටුම් කළමනාකරණ විලාසයන් වේ. ස්ටීවන් පී රොබින්ස් (1974) ගැටුමෙහි හැසිරීම් වර්ධනය දෘශ්‍යමාන කිරීමේ මාර්ගයක් සපයන 'ගැටුම් තීව්‍රතා සන්තතිය' (Conflict Intensity Continuum) ඉදිරිපත් කර ඇත. සියලුම ගැටුම් මෙම පරිමාණයෙන් කුමන ස්ථානයක හෝ පවතී (Robbins, 1974).

ලංකාවේ වර්තමාන තත්වය පිළිබඳව සලකා බැලූ විට පෙනී යන්නේ ලංකාව සම්පූර්ණයෙන්ම සාමය කරා පියමන්කොට නොමැති බවයි. පසුගිය වසරවල විවිධ

ආගමික කණ්ඩායම් අතර විවිධ අසමගීන්, මතභේදාත්මක සිදුවීම්, ප්‍රචණ්ඩකාරී හැසිරීම් වරින්වර රටෙහි විවිධ ප්‍රදේශ තුළ ඉස්මතු වූ අතර, 2014 අලුත්ගම දර්ගා නගරයේ සිද්ධිය, 2014 කුරගල සිදුවීම, 2018 දිගන සිදුවීම, 2019 පාස්කු ඉරිදා ප්‍රහාරය යනාදිය මේ සඳහා නිදසුන් වේ. මෙම විවිධ ගැටුම් හා සිද්ධීන් තුළින් ගම්‍යමාන වනුයේ ලංකාව තවමත් ගැටුමක් නොමැති තත්වය හෙවත් දිගුකාලින සාමය වෙත ලඟා වී නොමැති බවත්, ගැටුම යන්න ඕනෑම විටක, ඕනෑම තත්වයක් මත රට තුළ ඇති විය හැකි සංසිද්ධියක් බවට පත්වී ඇති බවත්ය.

**ගැටුම් වර්ගීකරණය**

විවිධ ගැටුම් වර්ගීකරණයන් ලෝකයේ පවතී. කෙසේ නමුත් මෙම වර්ගීකරණයන් තුළින් ගැටුමෙහි ස්වභාවය හා එය නිරාකරණය කිරීමේ මාර්ගය හඳුනාගත හැකිය. මෙම ගැටුම් වර්ගීකරණයන් අතරින් ගැටුම පහසුවෙන්ම හඳුනාගත හැකි ඉතාමත් සරල වර්ගීකරණයක් ලෙස පහත වර්ගීකරණය හඳුනාගත හැක. ඊට අනුව ගැටුම විවිධ ක්ෂේත්‍ර ගණනාවක (පුද්ගලික මට්ටමේ සිට පුළුල් සමාජීය හා පාරිසරික විවිධ මට්ටම් දක්වා) සිදු වේ. ඒ අනුව ප්‍රධාන වශයෙන් ගැටුම් මට්ටම් හතරක් හඳුනාගත හැකිය (Lewin, 1935).

ගැටුම් විවිධ අංශයන් හා මට්ටම්වලදී ඇති වේ.

- **අන්තර්-පුද්ගල (Intra-personal)** - පුද්ගලයකු තුළ ඇති ගැටුම.
- **අන්‍ය-පුද්ගල (Interpersonal)** - පුද්ගලයින් කිහිපදෙනෙකු අතර ඇති ගැටුම.
- **අන්තර්-සමූහ (Intra-group)** - කණ්ඩායමක් තුළ ඇති ගැටුම.
- **අන්‍ය-සමූහ (Inter-group)** - කණ්ඩායම් කිහිපයක් අතර ඇති ගැටුම (උදාः ජාතික හෝ ආගමික කණ්ඩායම් අතර).

මෙමගින් ගැටුම සඳහා සම්බන්ධ වී ඇති පාර්ශවයන් හඳුනාගනිමින් පහසුවෙන්ම ඊට අදාළ විසඳුම් සෙවීමට මෙම වර්ගීකරණය තුළින් හැකියාව ලැබේ.

**ගැටුම් ඇතිවීමට හේතු**

සාරධර්ම, රුචිකත්වයන් සහ සම්පත්වල වෙනස්කම් ඇතුළු විවිධ සාධක නිසා ගැටුම් ඇති වේ. ඩොයිෂ් (1973) ට අනුව, පාර්ශව තම ඉලක්ක නොගැලපෙන බව වටහා ගන්නා විට ගැටුම් ඇති වේ. ගැටුමට පොදු හේතු කිහිපයක් Deutsch (1973) දක්වා ඇත.

- **සම්පත් හිඟය** - ජලය, ඉඩම් සහ ධනය වැනි සීමිත සම්පත් බොහෝ විට ආරවුල් වලට තුඩු දෙයි (Homer-Dixon, 1999).
- **අනන්‍යතාවය සහ ජනවාර්ගිකත්වය** - රුවන්ඩා ජන සංහාරයේ දක්නට ලැබෙන පරිදි (Gurr, 2000) ජනවාර්ගික හා ආගමික වෙනස්කම් ඓතිහාසිකව ගැටුම් වලට හේතු වී ඇත.
- **දේශපාලන බල අරගල** - දේශපාලන පාලනය සඳහා තරඟය බොහෝ විට ගැටුම් වලට තුඩු දෙන බව සිවිල් යුද්ධ සහ විප්ලව මගින් පෙන්නුම් කෙරේ (Collier, & Hoeffler, 2004).
- **ආර්ථික අසමානතාවය** - ධනයේ විෂමතා සහ අවස්ථාවන්ට ප්‍රවේශ වීම සමාජ නොසන්සුන්තාවයට හේතු විය හැක (Piketty, 2014).
- **වැරදි වැටහීම් සහ වැරදි සන්නිවේදනය** - පාර්ශවයන් අතර වැරදි වැටහීම් ගැටුම් දක්වා වර්ධනය විය හැක (Fisher, 1990).

එයිඩල්සන් ආර්. සහ එයිඩල්සන්, ජේ. (2003) පෙන්වා දෙන්නේ ගැටුම්වලට බලපාන ප්‍රධාන මතධාරා පහක් පවතින බවයි.

1. උත්කෘෂ්ටභාවය
2. අසාධාරණත්වය
3. අනවබෝධය
4. අවිශ්වාසය
5. අසරණභාවය

ගැටුම් සඳහා හේතුවන කරුණු ආකෘති තුනක් ඔස්සේ හඳුනාගත හැකිය.

1. **මාර්ක්ස්වාදී විග්‍රහය (**Marxism) **-** බලය මිනිසුන්ගේ ජීවිත තත්වයන්ට බලපාන ප්‍රධාන සාධකයකි. ඒ අනුව මෙම බලය මූලික කොට ගනිමින් ගැටුම ඇති වේ.

2. **පාර්සෝනියානු ගැටුම්වාදී විග්‍රහය (**Parsonian Conflict Theory)- දහරෙන්ඩොර්ෆ් විසින් හඳුන්වා දෙන මෙම ආකෘතිය තුළින් බලධාරීන් හා අනිකුත් පාර්ශවයන් අතර බල අසමතාවය මත ගැටුම ඇති වන බව පෙන්වා දෙයි. එම අවස්ථාවේ දී, අධිකාරය මගින් පනවන නියෝග, විධාන, අනතුරු ඇඟවීම් සහ තහනම් කිරීම් මගින් අනිකුත් පාර්ශවයන් පාලනය කිරීමට සමාජීය වශයෙන් සිදු කෙරේ.

3. **ප්‍රභූත්ව ගැටුම්වාදී විග්‍රහය (**Elite Conflict Theory ) - සී. රයිට් මිල්ස් විසින් හඳුන්වා දෙන ලද මෙම න්‍යාය මගින් මිනිසුන් බලය භාවිතා නොකරන නමුත්, විධාන පිළිපැදිය යුතු වීම හේතුවෙන් සමාජය තුළ ගැටුම් උද්ගත වීම සිදු වේ (Mills, 1956).

ඉහත කරුණු අනුව පැහැදිලි වෙන්නේ  ගැටුම් බොහෝ හේතු නිසා ඇති විය හැකි අතර එය තනි පුද්ගලයන්ට හෝ කණ්ඩායම්වලට බොහෝ ආකාරවලින් බලපායි. මෙම සාධක අතර ජනවාර්ගික එදිරිවාදිකම් ප්‍රධාන ස්ථානයක් හිමි කරගනී. උතුරු අයර්ලන්තය, ඉතියෝපියාව, ශ්‍රී ලංකාව, සුඩානය, පිලිපීනය, පන්ජාබ් වැනි ප්‍රචණ්ඩකාරී සහ ආරක්ෂිත දේශපාලන ගැටුම් කිහිපයකට ශක්තිමත් ජනවාර්ගික පදනමක් පැවත ඇත (Eidelson, & Eidelson, 2003).

.ැටුම් නොවැළැක්විය හැකි සමාජ සංසිද්ධියක් වන්නේ මිනිසුන්ට පුළුල් ලෙස වෙනස් අවශ්‍යතා, රුචිකත්වයන් සහ දෘෂ්ටිකෝණ ඇති බැවිනි. ගැටුම තුළින් අන් අයගේ අදහස්වලට ගරු කිරීමට අපට හැකියාවක් පවති ද  සහ අන් අය සමඟ අපගේ වෙනස්කම් දරා ගැනීමට අපට කුසලතාවක්  තිබේද යන්න සොයා බැලීම සිදු කරයි (Commonwealth Secretariat, 2007).

ඔස්ට්‍රේලියානු ජාතික මනෝ විද්‍යාඥ  මයිකල් ඒ. හොග් සහ බ්‍රිතාන්‍ය ජාතික මනෝ විද්‍යාඥ ඩොමිනික් ඒබ්‍රහම් පවසන අන්දමට  පැහැදිලිවම සමූහයක් සතුව සමූහයේ සාමාජිකයන් සඳහා අදාළ වන සමාජීය වටිනාකම් හෝ සම්මතයන් තනි සාමාජිකයින්ගේ හැසිරීම නියාමනය කරයි. මෙහිදී තනි තනි සාමාජිකයන්ගේ ආකල්ප, හැඟීම්, අභිලාෂයන් සහ ඉලක්ක හේතුවෙන් කණ්ඩායමටම ඇති වන ප්‍රතිවිපාක හා ඒවා කණ්ඩායමේ පොදු වටිනාකම් හෝ සම්මතයන්ට සම්බන්ධව බලපාන අන්දම  මේ ගැටුම තුළ ගම්‍ය වේ (Hogg, & Abraham, 2001).

ඇමරිකානු ජාතික ස්ටීවන් පී. රොබින්ස්ට අනුව "ගැටුම යනු එක් පාර්ශවයක් තවත් පාර්ශවයක්  සැලකිලිමත් වන දෙයකට කැමති වීම හෝ  පළමු පාර්ශවය සැලකිලිමත් වන දෙයකට තවත් පාර්ශවයක් සෘණාත්මකව බලපෑම් කිරීම තුළින්  ආරම්භ වන ක්‍රියාවලියකි" (Robbins, 1974).

**ගැටුම පිළිබඳ න්‍යායන්**

ගැටුම පිළිබඳව විවිධ  කාලවකවානු තුළ  ලෝකයේ විවිධ න්‍යායන් ඉදිරිපත් වන ලදී. ඒවා ගැටුමේ ස්වභාවය,  ගැටුම් හට ගැනීම උදෙසා හේතුවන කරුණු, හා ගැටුමෙහි කාලය අනුව වෙනස් වීමට ලක් වේ. ගැටුම් හට ගැනීම උදෙසා හේතුවන කරුණු අනුව ඉදිරිපත් වූ න්‍යායන් ලෙස සමාජ අනන්‍යතා න්‍යාය, මානුෂීය අවශ්‍යතා න්‍යාය, ප්‍රජා සම්බන්ධතා න්‍යාය උදාහරණයන් වේ. මෙහි ජෝන් බර්ටන්ගේ මානුෂීය අවශ්‍යතා න්‍යායට (Human Needs Theory)  අනුව  ජාතික අනන්‍යතාව, ආරක්ෂාව,

සාධාරණත්වය, සහභාගීත්වය වැනි මූලික මානුෂීය අවශ්‍යතා නොපිරවීම තුල ගැටුම් උත්පාදනය කරන බවයි. ගැටුමේ ස්වභාවය අනුව සමාජ උපයෝගිතා න්‍යාය ද, එමෙන්ම ජොහැන්ස් ගැල්ටුන්ග් විසින් ඉදිරිපත් කළ සංස්කෘතික ආකෘති න්‍යායෙහි පදනම වන්නේ සමාජ සංස්කෘතිය තුළ ගැටුම ඇති වන ආකාරය පිළිබඳවය. ගැටුම ඇති වන කාලය අනුව එඩ්වර්ඩ් අසාර් විසින් 1990 දශකයේ මුල් භාගයේදී “Protracted Social Conflicts” යන සම්ප්‍රේෂණය මගින් මෙම න්‍යාය ඉදිරිපත් කළේය. ඔහු පෙන්වා දෙන්නේ, දිගුකාලීන සමාජ ගැටුම් බොහෝවිට ජාතික, සංස්කෘතික, භාෂාත්මක, ආගමික අනන්‍යතා ගැටුම් වශයෙන් හට ගැනේ. ඒ අතුරින් ගැටුම පිළිබඳ පරිවර්තන න්‍යාය සාමය ගොඩනැංවීම සඳහා වන සුවිශේෂී න්‍යායක් වේ (Burton, 1990).

එමෙන්ම ගැටුම් පරිවර්තන න්‍යාය යනු ජෝන් පෝල් ලෙඩරාක්ගේ සාමය ගොඩනැගීමේ න්‍යාය මාරි ඩුගන්ගේ විවිධ ගැටුම් මට්ටම් සහ ඒවායේ මූලාශ්‍ර හඳුනා ගන්නා ගැටුම් පිළිබඳ න්‍යාය සමඟ ඒකාබද්ධ කර, ගැටුම් හඳුනා ගැනීමට හා පරිවර්තනය කිරීම සඳහා පුළුල් රාමුවක් සපයයි.

**1. මාරි ඩුගන්ගේ විවිධ ගැටුම් මට්ටම් සහ ඒවායේ මූලාශ්‍ර හඳුනා ගන්නා ගැටුම් පිළිබඳ කුඩා කල සුසමාදර්ශී න්‍යාය**

• **ගැටළු-විශේෂිත ගැටුම:** මෙහිදී එකක් හෝ ඊට වැඩි ගැටළු ප්‍රමාණයකින් ගැටුම පැන නගී. තොරතුරු සම්බන්ධයෙන් එකඟ නොවීම්, එකඟ වූ තොරතුරු පිළිබඳ විවිධ අර්ථකථනයන් පැවතීම හෝ පුද්ගලයන් තුළ විවිධ උවමනාවන් පැවතීම නිසා මෙම ගැටුම් ඇති විය හැකිය. මෙම ගැටළු සංකීර්ණ විය හැකි අතර අනෙකුත් ගැටළු සමඟ ඒවායේ අන්තර් සම්බන්ධතා පැවතීම මගින් තවදුරටත් ගැටුම සංකීර්ණ කරනු ලැබේ (Dugan, 1996).


• **සම්බන්ධතා ගැටුම:** මෙම ගැටුම් එක් එක් පාර්ශවයන්ගේ අන්තර්ක්‍රියා රටා සහ එකිනෙකා කෙරෙහි ඔවුන්ගේ හැඟීම් හා සම්බන්ධ ගැටළු වලින් පැන නගී. එක් එක් පාර්ශවයනට ඉතිහාසයෙන් හිමිවන මානසික තුවාල මෙම ගැටුමට හේතු විය හැක. නිදසුනක් වශයෙන්, වර්තමාන ගැටළුව තුළ වර්තමානයේ හටගත් මුල හේතුවකට සම්බන්ධ නොවූවත්, අතීතයේ සිදු වූ සිදුවීම් මුලික කොටගනිමින් පුද්ගලයින් අද ගැටුම්වලට මුහුණ දිය හැකිය (Dugan, 1996).

• **පද්ධති මට්ටමේ ව්‍යුහාත්මක ගැටුම:** මෙම ගැටුම් සමාජ පද්ධතිය තුළ ගොඩනගා ඇති අසමානතාවයන් තුළින් පැන නගී. මේවා සමාජ, දේශපාලනික සහ ආර්ථික පද්ධති තුළ

ව්‍යුහගත ආකාරවලින් ආයතනිකකරණය වී ඇති අතර ස්වාභාවිකව සිදුවන ඒවා නොව මානව ක්‍රියාකාරකම් මගින් ඇතිවේ (Dugan, 1996).

• **උප පද්ධති මට්ටමේ ව්‍යුහාත්මක ගැටුම**: මෙය සිදුවන්නේ පාසලක්, ව්‍යාපාරයක්, පල්ලියක් හෝ නිවසක් වැනි සංවිධානාත්මක මට්ටමින් ය. උප පද්ධති මට්ටමේ ගැටුම් බොහෝ විට පුළුල් පද්ධතිමය ගැටුම් පිළිබිඹු කරන බව ඩුගන් සඳහන් කරයි (Dugan, 1996).

**රූපය 2 : මාරි ඩුගන්ගේ විවිධ ගැටුම් මට්ටම් සහ ඒවායේ මූලාශ්‍ර හඳුනා ගන්නා ගැටුම් පිළිබඳ කුඩා කල සුසමාදර්ශී න්‍යාය**




**(මූලාශ්‍රය: Dugan**, 1996)

## 2. ජෝන් පොල් ලෙඩරාක්ගේ සාමය ගොඩනැගීමේ න්‍යාය

ප්‍රසිද්ධ සාමය ගොඩනගන්නෙකු සහ ගැටුම් පරිවර්තන විශේෂඥයෙකු වන ජෝන් පෝල් ලෙඩරාක්, ඔහුගේ න්‍යායික සහ ප්‍රායෝගික පර්යේෂණ මගින් සාමය සහ ගැටුම් අධ්‍යයන ක්ෂේත්‍රයට සැලකිය යුතු දායකත්වයක් ලබා දී ඇත. ඔහුගේ කැපී පෙනෙන දායකත්වයක් වන්නේ ගැටුම් පරිවර්තන න්‍යායයි, එය තිරසාර සාමයක් අත්කර ගැනීම සඳහා ගැටුම්වල මූල හේතු තේරුම් ගැනීමේ සහ ආමන්ත්‍රණය කිරීමේ වැදගත්කම

අවධාරණය කරයි (Lederach, 2003). ලෙඩරාක් ගැටුම් නිරාකරණය සහ ගැටුම් පරිවර්තනය අතර වෙනස හඳුනා ගනී. ගැටුම් නිරාකරණය ක්ෂණික ගැටළු සඳහා විසඳුම් සෙවීම සහ ආරවුල විසඳීම කෙරෙහි අවධානය යොමු කරන අතර, ගැටුම් පරිවර්තනය ගැටුමට යටින් පවතින හේතු සහ පද්ධතිමය ගැටළු අවබෝධ කර ගැනීම කෙරෙහි ගැඹුරට යයි. පරිවර්තනය වඩාත් තිරසාර හා සාධාරණ සාමයක් ගොඩනැගීම සඳහා මෙම මූල හේතු හඳුනා ගැනීම අරමුණු කරයි (Lederach, 2003).


ලෙඩරාක් ගැටුම් මට්ටම් හතරක් හඳුනා ගනී. පුද්ගලික, සම්බන්ධතා, ව්‍යුහාත්මක සහ සංස්කෘතික වශයෙනි. සෑම මට්ටමක්ම ගැටුමේ විවිධ අංශ නියෝජනය කරන අතර, සියලු මට්ටම්වල ගැටුම් ආමන්ත්‍රණය කිරීම පුළුල් පරිවර්තනයක් සඳහා අත්‍යවශ්‍ය වේ (Lederach, 2005). ධනාත්මක සාමය සහ ඍණාත්මක සාමය පිළිබඳ සංකල්ප ද ඔහු පැහැදිලි කරයි. නූතන ශ්‍රී ලාංකේය සමාජයේ සාම ක්‍රියාවලිය පිළිබඳව සලකා බලන විට, ඍණාත්මක සාමයක් ඇත, එනම් ගැටුම් මතුපිටට යටින් පවතී, නමුත් මතුපිටින් එය සාමය ලෙස පෙනේ (Lederach, 2005). මෙය මිනිසුන්ට සංවාදයක යෙදීමට, ඔවුන්ගේ දුක්ගැනවිලි ප්‍රකාශ කිරීමට සහ සාමූහික විසඳුම් සෙවීම සඳහා වැඩ කිරීමට ඉඩ සලසන අවකාශයන් සහ ක්‍රියාවලීන් නිර්මාණය කිරීම සිදු වේ.

ගැටුම් ධනාත්මකව පරිවර්තනය කිරීම කෙරෙහි අසමානුපාතික බලපෑමක් ඇති කළ හැකි කුඩා ක්‍රියා හෝ මුලපිරීම් විස්තර කිරීමට ලෙඩරාක් "ක්‍රිටිකල් යීස්ට් (critical yeast)" යන යෙදුම භාවිතා කරයි. ඔහු "ධනාත්මක වෙනස" යන සංකල්පය ප්‍රවර්ධනය කිරීම මගින් ගැටුම් වලට විසඳුම් සෙවීමටත්, එහිදී ගැටුම් නිරාකරණය සම්බන්ධ සියලු පාර්ශ්වයන්ට ප්‍රතිලාභ ලබා දෙන ප්‍රතිඵලවලටත් මග පාදයි. එහිදී එක් පාර්ශ්වයක් ජයග්‍රහණය කරයි (Lederach, 2003). තීරණ ගැනීමේ ක්‍රියාවලීන්හි දී කර ඇති සහ අවදානමට ලක්විය හැකි කණ්ඩායම් ඇතුළුව සියලුම පාර්ශ්වකරුවන් සම්බන්ධ කර ගනිමින් සියලු පාර්ශ්වකරුවන්ගේ අදහස් පිළිගැනීමේ සහ ගරු කිරීමේ වටිනාකම ලෙඩරාක් පෙන්වා දෙයි. තවද තිරසාර සාමයක් සාක්ෂාත් කර ගැනීම සඳහා සියලු පාර්ශවයන්ගේ ඉදිරි දර්ශන පිළිගෙන ගරු කළ යුතු බව ඔහු විශ්වාස කරයි (Lederach , 2005).

ගැටුම් සහ සාමය ගොඩනැගීමේදී සංස්කෘතික හා ආගමික සිතුවිලි භාවිතයන්හි වැදගත්කම ලෙඩරාක් ද හඳුනා ගනී. මෙම අංශ අවබෝධ කර ගැනීම බෙදීම් මඟහරවා ගැනීමට සහ සංහිඳියාව සඳහා සංවාදයන් ගොඩනැගීමට පොදු පදනමක් සොයා ගැනීමට උපකාරී වේ (Lederach , 2003). ජෝන් පෝල් ලෙඩරාක්ගේ ගැටුම් පරිවර්තන

න්‍යාය ලොව පුරා සාමය ගොඩනැගීමේ භාවිතයන් හැඩගැස්වීමේදී පුළුල් ලෙස යොදා ගෙන ඇත. ඔහුගේ මෙම න්‍යාය තුළ ගැටුම් සමඟ සමස්තයක් ලෙස හඳුනාගනිමින් ඒවාට කල් පවත්නා සාමය සහ සංහිඳියාව ඇති කිරීම සඳහා සැඟවී පවතින ගැටළු නිරාකරණය කරන පරිවර්තනීය විසඳුම් සෙවීමේ වැදගත්කම ඉස්මතු කරයි.

**රූපය 3 : ජෝන් පොල් ලෙඩරාක්ගේ සාමය ගොඩනැගීමේ න්‍යාය**




**(මූලාශ්‍රය:** Lederach, **2003)**

ඉහත න්‍යායන් දෙක පිළිබඳවම අවධානය යොමු කල විට පෙනී යන්නේ ගැටුම සහජයෙන්ම ගතික බවත් නිරන්තරයෙන් වෙනස් වන බවත් ලෙඩරාක්ගේ න්‍යාය තුළ ඔහු අවධාරණය කරයි. ඒට ස්ථිතික ගැටලුවකට වඩා ක්‍රියාවලියක් ලෙස ප්‍රවේශ විය යුතුය (Lederach, 2003). ගැටුම් ස්ථරවලට වර්ගීකරණය කිරීමේදී ඩුගන්ගේ කුඩු කල සුසමාදර්ශී න්‍යාය මෙයට අනුපූරක වේ. එනම් ගැටළු-විශේෂිත, සම්බන්ධතා, පද්ධති මට්ටමේ ව්‍යුහාත්මක සහ උප පද්ධති මට්ටමේ ව්‍යුහාත්මක ගැටුම් මූලාශ්‍රවල අන්තර් සම්බන්ධිතභාවය සහ ඒවායේ ප්‍රකාශන ඉස්මතු කිරීමට මෙම න්‍යාය උපකාරී වේ (Dugan, 1996).

තිරසාර සාමයක් නිර්මාණය කිරීම සඳහා සියලුම පාර්ශවකරුවන්, විශේෂයෙන් සමාජයෙන් ආන්තීකරණය වන කණ්ඩායම් සම්බන්ධ කර ගැනීමේ වැදගත්කම ලෙඩරාක් පෙන්වා දෙයි (Lederach, 2005). ඒ හා සමානව, ඩුගන්ගේ රාමුව තුළ

සම්බන්ධතා, පද්ධතිමය සහ සංවිධානාත්මක සාධකවල අන්තර් ක්‍රියාකාරිත්වය සලකා බලයි (Dugan, 1996).

ලෙඩරාක්ගේ "ක්‍රිටිකල් යීස්ට්" සංකල්පය, පද්ධතිමය වෙනසක් ඇති කිරීමේදී කුඩා, උපායමාර්ගික මුලපිරීම්වල අසමානුපාතික බලපෑම අවධාරණය කරයි. මෙය පුළුල් පරිවර්තනයන් උත්ප්‍රේරණය කිරීම සඳහා ඉලක්කගත ප්‍රවේශ (උදා: ගැටළු-නිශ්චිත ගැටුම් විසඳීම හෝ උප පද්ධති අසමානතාවයන් ආමන්ත්‍රණය කිරීම) හඳුනා ගන්නා ඩුගන්ගේ රාමුව සමඟ සමපාත වේ (Lederach , 2003; Dugan, 1996).

ලෙඩරාක් ගැටුම් සහ සාමය ගොඩනැගීමේ සංස්කෘතික හා ආගමික මානයන් ඉස්මතු කරයි. පරිවර්තනීය ක්‍රියාවලීන්හි මෙම අංශ ඒකාබද්ධ කිරීමෙහි අවශ්‍යතාවය ඔහු මෙහිදී පෙන්වා දෙයි. (Lederach, 2005). සංස්කෘතික හා සම්බන්ධතා ගතිකත්වය පද්ධතිමය ගැටුම්වලට බලපාන ආකාරය පිළිබඳ ඩුගන්ගේ කුඩු කල සුසමාදර්ශී න්‍යාය මෙයට සහාය වේ (Dugan, 1996).

ගැටුම් නිරාකරණය ආරවුල් විසඳීම කෙරෙහි අවධානය යොමු කරන අතර, ලෙඩරාක් සහ ඩුගන් යන දෙදෙනාම යෝජනා කළ පරිදි ගැටුම් පරිවර්තනය, සැඟවී පවතින ගැටළු විසඳීමට සහ තිරසාර හා සාධාරණ සාමයක් සඳහා සබඳතා සහ පද්ධති නැවත සකස් කිරීමට උත්සාහ කල යුතුය (Lederach , 2003; Dugan, 1996)

**නිර්දේශ හා යෝජනා**

මේ අනුව සමස්තයක් ලෙස ගත් කල ගැටුම් යනු මානව සමාජයන් ගැඹුරු ආකාරවලින් හැඩගස්වන සංකීර්ණ සංසිද්ධියකි. එහි හේතු සහ වර්ග තේරුම් ගැනීම ඵලදායී විසඳුම් උපාය මාර්ග සකස් කිරීමට උපකාරී වේ. ගැටුම් විනාශකාරී විය හැකි අතර, ඒවා ඵලදායී ලෙස කළමනාකරණය කළ විට සමාජ වර්ධනය හා සමාජ පරිවර්තනය සඳහා අවස්ථා ද ඉදිරිපත් කරයි. එමෙන්ම ගැටුමක් ඇතිවීමක් මගින් සමාජයක ඇති බිඳ වැටීම් හෙළිදරව් කරයි. එබැවින් ගැටුම, යථාර්ථයකට මුහුණදීමේ ආරම්භය විය හැකි අතර, සාමය යනු එම යථාර්ථය ප්‍රතිසංස්කරණය කිරීමේ ක්‍රමවේදයකි.

මෙහිදී, ගැටුම් කළමනාකරණය සඳහා වන ක්‍රමවේදයන් හා න්‍යායන් තනි පාර්ශවික, බහු පාර්ශවික සහ සම්මුතිමය ප්‍රවේශයන් මත පදනම්ව සංවර්ධනය කළ යුතුය. විශේෂයෙන්ම බහු සංස්කෘතික, බහු ආගමික සහ විවිධ පාර්ශවයන් සම්බන්ධ වූ ගැටුම්

තුළ, සංවාදය, අන්‍යෝන්‍ය ගෞරවය සහ සාමකාමී සමවිමසීමේ සංස්කෘතියක් ගොඩනඟා ගැනීම අත්‍යවශ්‍ය වේ.

සාමය සහ ගැටුම අතර සබඳතාවය අනුගාමී හා පරිවර්තනීය බව අවබෝධ කර ගැනීම වඩා වැදගත් වන අතර සාම ව්‍යුහ ගොඩනැගීම සඳහා එය මූලික පදනම සපයයි. සාමය යනු සමාජ ආකෘතිකරණය තුළ ගැටුම් හඳුනාගෙන, ඒවා පිළිබඳ විවෘත, සාධාරණ හා සාමකාමී සංවාදයකින් හැසිරවීමේ ප්‍රතිඵලයකි. එය සාමාන්‍යයෙන් සත්‍යය හෙළිදරව් කිරීම, අවශ්‍යතා පිළිබඳ පිළිගැනීම්, සහ සබඳතා සදාචාරය යන මට්ටම් මත ගොඩනැගෙයි. ඒ අනුව ගැටුම යන සංකල්පය මනාව හඳුනා ගැනීම තුළ සාමයේ මාවත කරා එළඹීම පහසු කරයි.

ඒ අනුව, නිර්දේශ කළ හැක්කේ:

1. **ගැටුම් අධ්‍යාපනය (Conflict Education)** - පාසල්, විශ්වවිද්‍යාල සහ වෘත්තීය පුහුණු මට්ටමෙන් ගැටුම් කළමනාකරණය සහ සාමග්‍රි සම්භාවනාවන් පිළිබඳව විශේෂ පුහුණුවක් ලබාදිය යුතුය.
2. **නිසි ව්‍යාපෘති සහ ආයතනික මැදිහත්වීම්** - සමාජ සම්මුතිය වර්ධනය කිරීම සඳහා පළපුරුදු මැදිහත් වීමේ (mediation) ක්‍රම භාවිතා කරන ලද ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම.
3. **ගැටුම් පූර්ව අනාවරණය කිරීමේ ක්‍රමවේද** - සමාජය තුළ පවතින ආවේශක භාවයන්, අසමතුලිතතා හා අනන්‍යතා ව්‍යාජකරණය වැනි කරුණු අනාවරණය කරමින්, ගැටුම් ඇතිවීමට පෙර ඒවා අඩු කිරීමේ උපාය මාර්ග ක්‍රියාත්මක කළ යුතුය.
4. **සාම නිර්මාණය හා සත්‍ය සන්ධානයේ (Truth and Reconciliation) භූමිකාව** - පසුගිය ගැටුම්වලින් පීඩා විඳි සමාජයන් තුළ විශ්වාසය නැවත ගොඩනැගීම සඳහා සත්‍යය, සාධාරණය සහ සමාව මත පදනම් වූ සම්ප්‍රදායන් ගොඩනැගිය යුතුය.
5. **මනා පරිපාලනය හා සාධාරණතාවය** - සමාජ ගැටුම්වල මුලපිරුම් වන්නේ බහුතරයෙන් අසාධාරණ සහ විෂමතාවයන් බැවින්, ජනතා ගැටලුවලට වහා පිළිතුරු දිය හැකි, සම්බන්ධීකෘත, පැහැදිලි පරිපාලන ක්‍රමවේදයන් සවිබල ගැන්විය යුතුය.

අවසානයේ, ගැටුම යනු නිරතුරුවම සෘණාත්මක සාධකයක් ලෙස පමණක් නොව, නව අවස්ථා සහ සමාජ සංකල්පනය සඳහා ආරම්භයක් ලෙසද සැලකිය හැක. එවැනි සැලැස්වීමක් සඳහා නව පරම්පරාවන් තුළ ගැටුම පිළිබඳව විවෘත හා සාමකාමී අවබෝධයක් වර්ධනය විය යුතුය.

වර්තමාන සමාජය තුළ ගැටුම වාණිජ, පාරිසරික, ආගමික සහ රාජ්‍යමය මානයන් යටතේ පරිවර්තනය වී ඇති අතර, සාමය පිළිබඳ විවෘත, විචාරශීලී හා සමාජ-ආවේණික අවබෝධයක් වර්ධනය කිරීම බෙහෙවින් වැදගත් වේ. මෙහිදී සාමය තනි ප්‍රතිඵලයක් ලෙස නොව, සබඳතා ප්‍රතිසංස්කරණයක, අවශ්‍යතා පිළිගැනීම් වල, සහ විශ්වාස නැවත ගොඩනැගීමේ ක්‍රියාවලින්ගේ එකතුවක් ලෙස සමාජයට ඒත්තුගැන්වීම සිදු කිරීම අතිශය වැදගත් වේ.

**ආශ්‍රිත ග්‍රන්ථ නාමාවලිය**


Azar, E. E. (1990). *The management of protracted social conflict: Theory and cases*. Dartmouth Publishing.

Burton, J. W. (1990). *Conflict: Human needs theory*. St. Martin's Press.

Collier, P., & Hoeffler, A. (2004). Greed and grievance in civil war. *Oxford Economic Papers, 56*(4), 563–595.

Commonwealth Secretariat. (2007). *Preventing violent conflicts and building sustainable peace*. Commonwealth Secretariat.

Coser, L. A. (1956). *The functions of social conflict*. Free Press.

Deutsch, M. (1973). *The resolution of conflict: Constructive and destructive processes*. Yale University Press.

Doi, M. (2007). *Conflict resolution and the dynamics of peace*. Peace Studies Institute Publications.

Dugan, M. A. (1996). A nested theory of conflict. In J. P. Lederach (Ed.), *Conflict transformation and peacebuilding: A manual* (pp. 9–19). The Joan B. Kroc Institute for International Peace Studies.

Eidelson, R. J., & Eidelson, J. I. (2003). Dangerous ideas: Five beliefs that propel groups toward conflict. *American Psychologist, 58*(3), 182–192. https://doi.org/10.1037/0003-066X.58.3.182

Fisher, R. (1990). *Getting to yes: Negotiating agreement without giving in*. Penguin Books.

Galtung, J. (1969). Violence, peace, and peace research. *Journal of Peace Research, 6*(3), 167–191. https://doi.org/10.1177/002234336900600301

Gurr, T. R. (2000). *Peoples versus states: Minorities at risk in the new century*. United States Institute of Peace Press.

Hogg, R., & Abraham, D. (2001). Social norms and conflict resolution. *Journal of Social Psychology, 41*(1), 22–37.

Homer-Dixon, T. (1999). *Environment, scarcity, and violence*. Princeton University Press.

Jehn, K. A., & Mannix, E. A. (2001). The dynamic nature of conflict: A longitudinal study of intragroup conflict and group performance. *Academy of Management Journal, 44*(2), 238–251.

Lederach, J. P. (1997). *Building peace: Sustainable reconciliation in divided societies*. United States Institute of Peace Press.

Lederach, J. P. (2003). *The little book of conflict transformation*. Good Books.

Lederach, J. P. (2005). *The moral imagination: The art and soul of building peace*. Oxford University Press.

Lewin, K. (1935). *A dynamic theory of personality*. McGraw-Hill.

Mills, C. W. (1956). *The power elite*. Oxford University Press.

Piketty, T. (2014). *Capital in the twenty-first century*. Harvard University Press.

Robbins, S. P. (1974). Managing organizational conflict: A model for diagnosis and intervention. *Harvard Business Review, 72*(3), 65–74.

Rubin, J. Z., Pruitt, D. G., & Kim, S. H. (1994). *Social conflict: Escalation, stalemate, and settlement* (2nd ed.). McGraw-Hill.

විතාරණ, ත., & චන්ද්‍රසේකර, කා. (2012). ගැටුම් නිරාකරණය. සමුද්‍ර ප්‍රකාශකයෝ.